www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ඉන්දු-ඇමරිකා යුද අභ්‍යාසවල සාර්ථකත්වය තහවුරු කිරීම සඳහා ඉල්ලා අස්වෙන බවට ඉන්දියානු අගමැති තර්ජනය කරයි

**Indian PM threatened to resign to ensure success of Indo-US military exercise**

**ක්‍රාන්ති කුමාර හා කීත් ජෝන්ස් විසිනි**
**2006 පෙබරවාරි 01**

මෑත දී පල වූ පුවත්පත් වාර්තාවලට අනුව ඉන්දු ඇමරිකා ඒකාබද්ධ යුද අභ්‍යාස කිසිම බාධාවකින් තොරව ඉදිරියට පවත්වා ගෙන යනු පිනිස බටහිර බෙංගාලයේ වාම පෙරමුනු ආන්ඩුවෙන් සහතිකයක් ලබා ගැනීම සඳහා අසාමාන්‍ය තර්ජන රැල්ලක් ඉන්දීය අගමැති මන්මෝහන් සිං විසින් ප්‍රකාශයට පත් කරනු ලැබ ඇත. එක්සත් ප්‍රගතිශීලී සන්ධානයේ සභාග ආන්ඩුවේ ප්‍රධාන තනතුරෙන් සිං ඉල්ලා අස්වීම ද බටහිර බෙංගාලය "ජනාධිපති" හෝ මධ්‍යම ආන්ඩු පාලනය යටතට ගැනීම ද මෙම තර්ජනවලට ඇතුලත් විය.

ඉන්දීය හා ඇමරිකානු ගුවන් හමුදා බටහිර බෙංගාලයේ ඒකාබද්ධ යුද අභ්‍යාසයක් ආරම්භ කිරීමට දින කීපයකට පෙර නොවැම්බර් මස මුලදී බටහිර බෙංගාල ප්‍රධාන ඇමති සහ ඉන්දීය කොමියුනිස්ට් පක්ෂයේ (මාක්ස්වාදී) දේශපාලන මන්ඩල සාමාජික බුඩාඩෙබ් බට්ටාචාරිජී සමග දුරකථන සාකච්ඡාවක දී මෙම තර්ජන මන්මෝහන් සිං විසින් කරනු ලැබ ඇති බව පිලිගැනේ. වාමාංශික පෙරමුන මගින් පාලනය කෙරෙන බටහිර බෙංගාලය තුල ඇමරිකානු අධිරාජ්‍යවාදයට විරුද්ධව පවතින ජනතා විරෝධතාවය හේතුවෙන් මෙම අභ්‍යාසවල ආරක්ෂාව සම්බන්ධව තමන්ට සහතික විය නොහැකි බවට අනතුරු අඟවමින් බට්ටාචාරිජී මධ්‍යම ආන්ඩුවට බල කර සිටියේ යුද අභ්‍යාස පැවැත්වීමට තෝරා ගෙන ඇති ස්ථානය වන බටහිර බෙංගාලයෙන් එය වෙනත් තැනකට ගන්නා ලෙසයි. වාර්තාවලට අනුව මන්මෝහන් සිං බට්ටාචාරිජීට කිසිම බුරුලක් දී නොමැත. ඉන්දීය ආන්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව ආරක්ෂාව හා හමුදා කටයුතු සම්බන්ධව මධ්‍යම ආන්ඩුවට සම්පූර්න අධිකාරය තිබෙන බව අවධාරනය කරමින් ඔහු බට්ටාචාරිජීට කියා සිටියේ බෙංගාල ආන්ඩුව මධ්‍ය ආන්ඩුවේ අභිලාශයන්ට හිස නමන්නේ නැත්නම් තමාට අගමැති තනතුරින් ඉල්ලා අස්වීමට හෝ එසේ නැත්නම් ප්‍රාන්ත රාජ්‍යය විසුරුවා හැර ඒ මත මධ්‍යම ආන්ඩුවේ පාලනය ප්‍රතිශ්ඨාපනය කිරීමට සිදුවන බවයි.

මෙයින් කුමන ක්‍රියා මාර්ගයක් ගත්ත ද එය දැවැන්ත දේශපාලන අර්බුදයක් පැන නංවනු ඇත. කොන්ග්‍රස් පක්ෂය විසින් නායකත්වය දෙනු ලබන එක්සත් ජනතා සන්ධාන රජය පාර්ලිමේන්තු බහුතරය සඳහා ඉන්දීය කොමියුනිස්ට් පක්ෂය (මාක්ස්වාදී) සීපීඑම් විසින් නායකත්වය දෙනු ලබන වාම පෙරමුනේ පාර්ලිමේන්තු සහය මත පදනම් වන බහු පාක්ෂික සභාගයකි. මන්මෝහන් සිං ගේ ඉල්ලා අස්වීම ආන්ඩුවේ ඉදිරි පැවැත්ම ප්‍රශ්නයට ලක්කරනු ඇත.

ඒ හා සමානව ම, ඉන්දීය ඇමරිකානු මිලිටරි සංස්ථාපිතයන්ගේ සමීප සබඳතාවය ගොඩ නැගීමේ ඉලක්කය ඇතිව; 1977 සිට අඛන්ඩව මැතිවරන හයකින් ම බලයට පත්ව ඇති බටහිර බෙංගාලයේ වාම පෙරමුනු රජය විසුරුවා හැරීම සඳහා මධ්‍යම ආන්ඩුව විසින් ගනු ලබන ඕනෑම උත්සාහයක් ඉදිරියේ දී එක්සත් ජනතා සන්ධානය බලයේ රඳවා ගැනීමට වාම පෙරමුනට නොහැකි කරවනු ඇත. ඊටත් වඩා වැදගත් වන්නේ එය වැඩෙමින් පවතින ඉන්දියානු ප්‍රභූ පන්තියේ නව ලිබරල්වාදී ආර්ථික ප්‍රතිසංස්කරන වැඩ පිලිවලට හා ඇමරිකාව සමඟ වර්ධනය වන මුලෝපායික හවුලට එරෙහිව නැගී එන මහජන විරෝධය මැඩීම සඳහා ඒකාධිපති ක්‍රමවේද පාවිච්චි කිරීමේ උත්සාහයක් ලෙසට දසලක්ෂ ගනන් ඉන්දියානු කම්කරුවන් සහ පීඩිතයින් විසින් අර්ථ විග්‍රහ කරනු ලැබෙනු ඇත යන්නයි.

මන්මෝහන් සිංගේ තර්ජනවල පිපිරෙනසුලු බව සලකා බැලීමේ දී ඔහු වංචාවක නිරත වන බව විශ්වාස කිරීම හේතු සහගත ය. කොහොම නමුත් ඔහු එවැනි ආන්තික පියවර ගැනීමට තර්ජනය කිරීම පවා

අවධාරනය කරන්නේ ඇමරිකාව සමග ඉතා සමීප මිලිටරි සබඳතාවයක් ඉදිරියට ගෙන ඒමට කොන්ග්‍රස් නායකත්වයේ තිර අධිෂ්ඨානය යි. සිංට සමහරවිට තව දුරටත් අවශ්‍ය වූයේ විදේශ ප්‍රාග්ධනය අකර්ෂනය කර ගැනීම සඳහා අති මූලික වූ ආන්ඩුවේ සැලසුම් වන නව ලිබරල්වාදි පුද්ගලීකරන වැඩ පිලිවෙල, රාජ්‍ය ආයෝජන ඉවත් කර ගැනීම, රෙගුලාසි ඉවත් කිරීම පුද්ගල ආදායම් ඉහල දැමීමේ වැඩ පිලිවෙලට යෙදවූ මුදල් මිලිටරි හා යටිතල පහසුකම් පිලිබඳ ව්‍යාපෘතියට යෙදවීම ආදිය පිලිබඳව ගැටුමට යාමෙන් වැලකී සිටීමට ආන්ඩුව උත්සාහ නොදරන බව පිලිබඳව පැහැදිලි සංඥාවක් ඔහුගේ වමාංශික සගයින්ට යැවීමට විය හැකිය.

එය බොරු පුරසාරමක් වුවද නැත ද, මන්මෝහන් සිංගේ තර්ජනවලින් බලාපොරොත්තු වූ ප්‍රතිපල ලැබී ඇත. සීපීඑම් නායකත්වය දරන බටහිර බෙංගාල රජය සම්පූර්නයෙන් යටහත් වී ඇත. යුද අභ්‍යාසවල සාර්ථකත්වය සහතික කිරීම සඳහා අවශ්‍ය සියලු ම ආරක්ෂක විධි විධාන සපයමින් ද ප්‍රාන්ත රාජ්‍ය යන්ත්‍රය මධ්‍යම ආන්ඩුවට අවශ්‍ය පරිදි හසුරුවා ගැනීමට ඉඩදෙමින් ද බට්ටාචාරිජි තම සම්පූර්න සහයෝගය ප්‍රකාශ කොට ඇත.

වඩාත්ම වැදගත් වන්නේ බට්ටාචාරිජි හෝ වෙනත් කිසිම සීපීඑම් නායකයකු මන්මෝහන් සිංගේ තර්ජන වත් විශේෂයෙන්ම ජනාධිපති පාලනයක් අධිස්ථාපනය කිරීමේ තර්ජනය වත් පිලිඳව කම්කරු පන්තියට වචනයක් හෝ පවසා නොතිබීම යි. එසේ කලා නම් පීඩනයක් දමා ජනතා හිතවාදී ප්‍රතිපත්ති ක්‍රියා කරවා ගැනීමට තමන්ට හැකිය යන පදනම මත නව දිල්ලියේ බලයේ රඳවාගෙන සිටින ආන්ඩුවේ ස්වරූපය පිලිබඳව ස්ටැලින්වාදීන්ට උභතෝකෝටික වන ප්‍රශ්න මතු කෙරෙනු ඇත.

පසු ගිය අවුරුදු 29 ක් තිස්සේ තමන්ගේ බටහිර බෙංගාලයේ ඉන්දියානු ධනවාදය කලමනාකරනය කිරීමේ ප්‍රතිපල ලෙස ස්ටැලින්වාදීන්ට ලැබෙන වරප්‍රසාදවලට හා ලාභ ප්‍රයෝජනවලට ඔවුන් ඇත්තටම ඇලී ගැලී සිටින්නේ වී නමුත් ස්ටැලින්වාදීන් මධ්‍යම ආන්ඩුවට යටත් වීම හුදු බියගුලුකම පිලිබඳ ප්‍රශ්නයක් නො වේ. පවත්නා දේශපාලන පද්ධතිය ආරක්ෂා කරන්නන් බටහිර බෙංගාලයේ ජනාධිපති පාලනය බලපෑම් කිරීමට තැත්කිරීමකට එරෙහිව ඉන්දියාව තුලමත් ප්‍රාන්ත රාජ්‍යයෙන් ඇතිවිය හැකි ප්‍රකෝපකාරී මහජන ප්‍රතිරෝධය ගැන බියට පත් වී ඇත.

නොවැම්බර් මස 7 වන දිනෙන් පටන් ගෙන දින 12ක් තිස්සේ බටහිර බෙංගාලයේ බටහිර මිඩ්නපූර් දිස්ත්‍රික්කයේ කලයිකුන්ඩා ගුවන් හමුදා මූලස්ථානයෙන් දියත් කෙරුනු ඉන්දු ඇමරිකා ඒකාබද්ධ ගුවන් අභ්‍යාසය දෙරට විසින් මෙතෙක් ක්‍රියාත්මක කරන ලද විශාලතම ගුවන් අභ්‍යාසය ලෙස සැලකේ. ඇමරිකානු ගුවන් හමුදාවේ එෆ්-16 වර්ගයේ සම්පූර්න බල ඇනියක් (ස්කොඩ්රනයක් ) සහ ගුවන් ගත අනතුරු ඇඟවීම් හා පාලන (ඒඩබ්ලිව්ඒසී) පදධති ගුවන් යානයක් ද මෙම අභ්‍යාස සඳහා යෙදවිනි.

සීතල යුද්ධයේ අවසානයේ සිට ඇමරිකාව සහ ඉන්දියාව අතර මිලිටරි සහයෝගිතාවය අතිශයින් වර්ධනය විය. එක්සත් ජාතීන්ගේ අවසරයකින් තොරව විදේශ රටවල ඒකාබද්ධ ඉන්දු ඇමරිකා මෙහෙයුම් සඳහා ඉඩකඩ සැලසෙන්නාවූද ඇමරිකාවේ නිෂ්පාදිත ආයුධ සහ ආයුධ පද්ධතීන් විශාල ප්‍රමානයක් ඉන්දියාව විසින් මිල දී ගැනීමට මග සැලසෙන්නාවූද නව ආරක්ෂක ගිවිසුමක් පසු ගිය ජුනි මස ඇමරිකා එක්සත් ජනපදය සහ ඉන්දියාව විසින් අත්සන් තබන ලදි. ඇෆ්ඝනිස්ථානය ඇමරිකාව විසින් ආක්‍රමනය කිරීමට සහය දක්වීමෙන් ද ඉරාකයේ ඇමරිකන් රූකඩ ආන්ඩුව පිලිගැනීමෙන් ද පසු ගිය සැත්තැම්බර් මාසයේ ජාත්‍යන්තර පරමානු බලශක්ති කොමිසමේ (අයිඒඊඒ) රැස්වීමේ දී ඉරානයට විරුද්ධව ඇමරිකාව සහ යුරෝපා හවුල සමග එක්ව ඡන්දය පාවිච්චි කිරීමෙන් ද භූ-දේශපාලනිකව ඉන්දියාව ඇමරිකා එක්සත් ජනපදයට වඩාත් සමීපව කියා කරමින් සිටි.

මෙම වර්ධනයන් විසින් කෙරෙන අනතුරු ඇඟවීම් ඉදිරියේ බටහිර බෙංගාල ප්‍රාන්ත මැතිවරනය ලඟ එන තත්වය තුල ඉන්දියානු ස්ටැලින්වාදීන් තම වාමාංශික චරිත සහතික අලුත්වැඩියා කර ගැනීම සඳහා පසු ගිය නොවැම්බර් මස අභ්‍යාස පිලිබඳ සිද්ධිය මතු කරන ලදී. නමුත් ඔවුන්ට අවසානයේ සිදු වූයේ නින්දා සහගත ලෙස පසු බැසීමට ය.

සීපීඑම් ක්‍රියාකාරීන් ද කම්කරුවන්ද, අනෙකුත් වාංමාංශිකයන් ද විශාල සංඛ්‍යාවක් ඉන්දු ඇමරිකා ගුවන් හමුදා අභ්‍යාස විරෝධී විරෝධතාවලට සහභාගි වූ අතර එසේ විරෝධතා දක්වන අතරතුර ම බොහෝ දෙනෙක් එකී අභ්‍යාසවලට තම කෝපය ප්‍රකාශ කලහ. බට්ටාචාරිජි මධ්‍යම ආන්ඩුව සමග ඇති කරගෙන තිබූ ගිවිසුමේ කොන්දේසි යටතේ ගුවන් හමුදා අභ්‍යාස බාධාවකින් තොරව කරගෙන යෑම සහතික කිරීම සඳහා එකී විරෝධතාවන්ට විශාල වසයෙන් පොලීසිය යොදවන ලදී.

මන්මෝහන් සිංගේ තර්ජනවල බරපතල කම කෙසේ වී නමු දූ බට්ටාචාරිජි සමග ඔහු පැවැත් වූ සාකච්ඡාවට ඉන්දියානු පුවත්පත් මාධ්‍යවලින් දී තිබුනේ ඉතා අල්ප ප්‍රසිද්ධියකි. වාම පෙරමුන සමග ඉතා සමීප සබඳතා තිබෙන හින්දු පත්‍රය ජනවාරි 8 වන දින සීපීඑම් මහලේකම් ප්‍රකාශ් කරාත් ගේ ත්‍රිපුර සංචාරය වාර්තා කරන අතරතුර ගුවන් අභ්‍යාස ගනුදෙනුව ගැන සඳහන්

කලේ වක්‍ර ආකාරයකිනි. හින්දු පත්‍රයට අනුව කරාත්ගෙන් මන්මෝහන් සිංගේ ඉල්ලා අස්වීමේ තර්ජනය ගැන ප්‍රශ්න කල අවස්ථාවේ "අගමැතිතුමා ඉල්ලා අස්වීමට යන බවට ප්‍රවෘත්තියක් මට අසන්නට ලැබුනු මුල් අවස්ථාව මෙයයි" යනුවෙන් ඔහු ප්‍රකාශ කොට ඇත.

නමුත් මින් පසුව මෙයට පසුවිපරමක් ලෙස හෝ කොයිම වෙලාවක වත් තමාගේ සහෝදර දේශපාලන මන්ඩල සාමාජික බට්ටාචාරිජි, සිංගේ තර්ජනය පිලිබඳව තමාට නොදැන්වීම සිදුවූයේ කෙසේ ද යන්න හෝ සීපීඑම් නායකත්වය ඉතා හදිසියේ ක්ෂනිකව බටහිර බෙංගාලයේ ගුවන් අභ්‍යාස පිලිබඳව තම විරෝධය අත්හැර දැම්මේ ඇයි ද යන්න හෝ කරාත්ගෙන් ප්‍රශ්න කිරීමක් මෙම පුවත් පතින් සිදු නොවිනි. එමෙන්ම බටහිර බෙංගාලයේ මහ ඇමති ද මෙම ගනු දෙනුව සම්බන්ධව කිසිම විස්තරයක් කිරීමෙන් වැලකී සිටින බව පැහැදිලිය.

තම ලිබරල් ප්‍රතිසංස්කරන සහ ඇමරිකාව සමග සමීප සබඳතාවලට ආවඩන ප්‍රධාන පත්‍රයක් වන ඉන්ඩියන් එක්ස්ප්‍රස් පුවත් පත "අගමැතිගේ වාම කොක්ක" යන මැයෙන් කෙටි වාර්තාවක ප්‍රතිඵලය සම්බන්ධව පමනක් නොව; සාමාන්‍යයෙන් මෘදු වචන භාවිතාකරන සිංට අවශ්‍යවූ අවස්ථාවේ ස්ටැලින්වාදීන්ට තදින් ආමන්ත්‍රනය කිරීමට හැකිවීම ගැනද තම අසීමිත තෘප්තිය ප්‍රකාශ කලේ ය.

මන්මෝහන් සිං බට්ටාචාර්ජි සමග පැවැත්වූ සාකච්ඡාව පිලිබඳ ඉතාමත් විශිෂ්ට වාර්තාව අන්තර්ගත වූයේ Rediff.com රෙඩිෆ්ඩොට්කොම් වෙබ් අඩවිය තුල ය. ජනවාරි 7 දින එහි "ඉන්දු ඇමරිකා අභ්‍යාසයට සීපීඑම් විරෝධතාවය මත මන්මෝහන් ඉල්ලා අස්වීමට යයි" යන මැයෙන් ලිපියක් පලවිය. එහි වාර්තාවූනේ " ආන්ඩුව තුල අගමැති ඉල්ලා අස්වීමට සූදානම්ව ඇති බව දන්නේ අතලොස්සක් වුවත් එය ද ඉන්දියාවේ ෆෙඩරල් ව්‍යූහය තුල මධ්‍යම ආන්ඩුව විසින් දෙනු ලබන පොරොන්දුවකින් ප්‍රාන්ත රාජ්‍ය බැඳී සිටින බවට පනිවිඩයක් යැවීමෙන් පසුව ය" යනුවෙනි.

මිලිටරි කටයුතු සම්බන්ධව මධ්‍යම ආන්ඩුවට ආන්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ලැබී ඇති තනි බලය සහ මධ්‍යම ආන්ඩුව විසින් ඇති කරගෙන ඇති ආරක්ෂක ගිවිසුම්වලට ගරුකිරීමට ප්‍රාන්ත රාජ්‍යවල යුතුකම ස්ථිර කරමින් කැබිනට්මන්ඩලය යෝජනා සම්මත කර ගැනීම තුලින් ගුවන් අභ්‍යාසය කිසිම බාධාවකින් තොරව ඉදිරියට ගෙනයෑම සහතික කිරීමට මන්මෝහන් සිං තම අධිෂ්ඨානය අවධාරනය කොට ඇති බව ද එකී ලිපිය මගින් වාර්තා කෙරින.

තම වාර්තාව දැනට ඉවත් කොට ඇතත්, ඉල්ලා අස්වීමේ තර්ජනයට ප්‍රමුඛ තැනක් දුන් අනෙක් එකම ප්‍රවෘති වෙබ් අඩවිය වුනේ ප්‍රාදේශීය දිනපතා පුවත්පතක් වන 'කාෂ්මීර් ටයිම්ස්ය'. පුවත් වාර්තාවන් උපුටා දක්වමින් ටයිම්ස් ලිපිය සඳහන් කලේ රජයේ ඉල්ලීම් අනුව ක්‍රියා කිරීමට බලකිරීම සඳහා තර්ජන පාවිච්චි කිරීමට මන්මෝහන් සිංගේ සූදානම ගැන ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පුරසාරම් දොඩා ඇති බවයි. "ඇමරිකාව හා සම්බන්ධ ප්‍රධාන ප්‍රශ්නයක් මතු වී ඇති අවස්ථාවක අගමැති තුමා තම ධෛර්යය පෙන්වයි" යනුවෙනි.

මෙම ගනුදෙනුව පිලිබඳ සෝදිසියක් කිරීමට ඉන්දියානු පුවත්පත් මාධ්‍යවල අසමත් වීම පිලිබිඹු කරන්නේ ඉන්දියාවේ පන්ති සම්බන්ධතා පිලිබඳවත් එමගින් එලිදරව් කෙරෙන්නේ කුමක් ද යන්න පිලිබඳවත්, ආන්ඩුවේ අතිශය දුර්වල තත්වයක්; ඇමරිකාව සමග සමීප සහයෝගීතාවය ඉදිරියට ගෙනයෑමේ දී ප්‍රකෝපකාරී හා ආධිපත්‍යවාදී තර්ජන පාවිච්චි කිරීමට එහි ඇති සූදානමත්; ස්ටැලින්වාදීන්ගේ දේශපාලන නිවට බව හා එක්සත් ජනතා සන්ධාන ආන්ඩුවේ ස්වභාවය ගැන ජනතාවගේ ඇස්වලට වැලි ගසමින් තමන්ගේ මූලික ලාභ ප්‍රයෝජන තර්ජනයට ලක් වේ යැයි විශ්වාස කරන අවස්ථාවලදී ඉතා මර්දනකාරී නීතිරීතිවල පිහිට සෙවීමට පාලක පන්තියේ ඇති සූදානම ආවරනය කිරීමේ ස්ටැලින්වාදීන් යෙදී සිටිනා බවත්, පිලිබඳව එමගින් හෙලි කරන කරුනු සම්බන්ධව ඉන්දියානු පාලක ප්‍රභූවේ එහි වාම සගයන්ගේ සංවේදී බවයි.

© www.wsws.org